## FIB (ඔබේ ව්‍යාපාරය වැඩි දියුණුකර ගැනීමට පදනම)

**යොමුව :**

වසරකට වැඩි කාලයක් ව්‍යාපාරික අත්දැකීම් ඇති ව්‍යවසායකයින් (සුළු/ගෘහස්ථ ව්‍යාපාර ඉලක්ක කර ඇත.)

**අරමුණ :**

ව්‍යාපාර කළමනාකරණ සංකල්පයන්හි මූලික කරුණු අවබෝධ කරදීම (වාර්තා තැබීම, පිරිවැයකරණය, අලෙවිකරණය, ව්‍යාපාර සැලසුම්කරණය)

**අන්තර්ගතය :**

- ව්‍යාපාර වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය මූලික කළමනාකරණ සංඝටක
- ඔබේ පාරිභෝගිකයින් තෘප්තිමත් කළ හැක්කේ කෙසේද?
- ඔබේ නිෂ්පාදනය හෝ සේවාව සඳහා පිරිවැය ගණනය කළ හැක්කේ කෙසේද?
- ඔබේ තොග කළමනාකරණය කරන්නේ කෙසේද?
- ඔබේ ව්‍යාපාර වාර්තා තබාගන්නේ කෙසේද?
- ඵලදායී ලෙස මිලදී ගැනීම් කරන්නේ කෙසේද?
- ඔබේ මුදල් නිසි ලෙස කළමනාකරණය කරන්නේ කෙසේද?

**කාලය : පැය 14යි.**




### ඔබට සහය දීමට අපි කැමැත්තෙමු

ඔබේ ඉලක්ක කණ්ඩායම්වල ජීවනෝපායන්, ස්වයං රැකියා හෝ සුළු ව්‍යවසායයන් තිරසාර කිරීමේ අරමුණින් බිම්මට්ටමේ ප්‍රජාවන් සමඟ කටයුතු කරන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, ජාතික සහ ප්‍රාදේශීය අධිකාරීන් සහ රාජ්‍ය නොවන සංවිධානවලට සහයදීමට අපි අදහස් කරමු. SIYB සඳහා පදනම යනු ඉතා ප්‍රබල සහ ප්‍රතිඵල මූලික කරගත් පුහුණු පැකේජයක් වන අතර, මෙහි ප්‍රතිඵල සහතික කෙරේ.

**SIYB යනු ව්‍යවසාය සංවර්ධනය, ආර්ථික බල ගැන්වීම සහ දුගීබව තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන වල ආයතනික ඉලක්ක ඉටුකර ගැනීමට ඇති විශිෂ්ඨ මෙවලමකි.**

වැඩි විස්තර
**SIYB ශ්‍රී ලංකා සංගමය**
නො: 21/22 A, පොල්හේන්ගොඩ උද්‍යානය,
පොල්හේන්ගොඩ පාර, කොළඹ 05
දුරකථනය : +94 112810869 ෆැක්ස් : +94 112827693
ඊමේල් : ceo@siybsrilanka.org
වෙබ්අඩවිය : www.siybsrilanka.org

SIYB Sri Lanka
WE SET THE STANDARDS IN MANAGEMENT TRAINING

# SIYB සඳහා පදනම

ජීවනෝපායක සිට ව්‍යාපාරයක් දක්වා මඟ

**ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සමඟ ක්‍රියාකාරී හවුල්කාරීත්වය**

SIYB
START AND IMPROVE YOUR BUSINESS

**SIYB ශ්‍රී ලංකා සංගමය ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පිහිටි SIYB ජාත්‍යන්තර කාර්යාලයේ සහතිකලත් නියෝජිත ආයතනයකි.**

## SIYB සඳහා පදනම (ඔබේ ව්‍යාපාරය ආරම්භ කිරීමට හා වැඩිදියුණු කර ගැනීමට පදනම)

SIYB සඳහා පදනම යනු දැනට පවතින ආරම්භ කිරීමට සූදානම් සුළු සහ ගෘහස්ථ ව්‍යාපාර ඉලක්ක කොට සකස් කරන ලද, නව්‍යතාවයකින්යුත්, ඉතා කාර්යක්ෂමව මෙන්ම සරලව ඉදිරිපත් කෙරෙන පුහුණු සංකල්පයකි. මෙය SIYB ශ්‍රී ලංකා සංගමයේ නව පුහුණු පැකේජයක් වන අතර, සිය ඉලක්ක ප්‍රජාවන්ගේ ජීවනෝපාය ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් යුතුව අඩු ආදායම් ලාභී ප්‍රජාවන් සමඟ කටයුතු කරන රාජ්‍ය දෙපාර්තමේන්තු, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වඩාත් උචිත මෙවලමකි.

මෙම පුහුණු පැකේජය වෙනස් වූ ඉලක්ක කණ්ඩායම් සතරකට ඉලක්ක කරන අතර, එය SIYB පවුලේ පුහුණු පැකේජයක් ලෙස ඉදිරිපත් කෙරේ.

- ව්‍යාපාරයට මඟ (WTB) - ව්‍යාපාර පිළිබඳව හැඳින්වීම.
- ඔබේ ව්‍යාපාරික අදහස ජනිත කිරීමට පදනම (FGB) - වඩාත් උචිත ව්‍යාපාරය හඳුනා ගැනීම.
- ඔබේ ව්‍යාපාරය ආරම්භකිරීමට පදනම (FSB) - සරල සැලැස්මක් සහ ව්‍යාපාරයක් ආරම්භ කිරීම.
- ඔබේ ව්‍යාපාරය වැඩි දියුණු කර ගැනීමට පදනම (FIB) - ව්‍යාපාර කළමනාකරණයෙහි මූලික සංකල්ප හැඳින්වීම.

## පුහුණු පැකේජයෙහි ප්‍රධාන ගුණාංග

- කෙටි, මොඩියුලාකාර සහ අවශ්‍යතාවන්ට අනුව පහසුවෙන් වෙනස් කල හැකිවීම.
- උසස් සහභාගීත්වයකින් යුතු සහ ක්‍රියාකාරකම් මුල්කරගත් වැඩසටහනක් වීම.
- පුහුණු අත්පොත් සහිත වීම.
- ප්‍රත්‍යක්ෂ සහ ක්ෂණික ප්‍රතිඵල සහිත පුහුණු මොඩියුලයක් වීම.
- පුහුණුවෙන් පසු සෑම ප්‍රතිලාභියෙකුටම පුද්ගලික උපදේශන සේවාවක් සපයන පසුවිපරම් සංඝටකයක් සහිතව නිර්මාණය කරන ලද වැඩසටහනක් වීම.

## WTB (ව්‍යාපාරයට මඟ)

**යොමුව:**
සිය අනාගත දිශාව තීරණය කරන, රැකියා විරහිත තරුණ තරුණියන්, පාසැල් හැරයන්නන්, වෘත්තීය පුහුණු පාඨමාලා සිසුන්

**අරමුණ :**
තරුණ තරුණියන් තුළ ව්‍යවසායික සංස්කෘතියක් ගොඩනැඟීම.

**අන්තර්ගතය :**

- ව්‍යාපාරික පුද්ගලයෙකු යනු කවරෙක්ද?
- ව්‍යාපාරයක් යනු කුමක්ද?
- ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වැදගත්කම

**කාලය : පැය 05 යි**

## FGB (ඔබේ ව්‍යාපාරික අදහස ජනිත කිරීමට පදනම)

**යොමුව :**
ස්ථිර ව්‍යාපාරික අදහස් නොමැති, විභවයක් සහිත ව්‍යවසායකයින්, ස්වයං රැකියා ලාභීන් සුළු/ගෘහස්ථ ව්‍යාපාර ඉලක්ක කණ්ඩායම් වේ.

**අරමුණ :**
වඩාත්ම උචිත ව්‍යාපාරය හඳුනා ගැනීම.

**අන්තර්ගතය:**

- ව්‍යවසායකයෙක් යනු කවරෙක්ද?
- ව්‍යවසායෙකුගේ ලක්ෂණ මොනවාද?
- ව්‍යාපාරික අදහස් ජනනය කළ හැක්කේ කෙසේද?
- වඩාත්ම උචිත ව්‍යාපාරික අදහස තෝරාගත හැක්කේ කෙසේද?

**කාලය : පැය 08යි.**

## FSB (ඔබේ ව්‍යාපාරය ආරම්භ කිරීමට පදනම)

**යොමුව :**
ස්ථිර ව්‍යාපාරික අදහස් සහිත, විභවයක් ඇති ව්‍යවසායකයින් (සුළු/ගෘහස්ථ ව්‍යාපාර කෙරෙහි ඉලක්ක කර ඇත.)

**අරමුණ :**
මූලික ව්‍යාපාර දැනුමක් සහිතව සරල ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම.

**අන්තර්ගතය :**

- ව්‍යාපාර සැලැස්මක් යනු කුමක්ද?
- ව්‍යාපාර සැලැස්මක ප්‍රධාන සංඝටක මොනවා ද?
- සරල ව්‍යාපාර සැලැස්මක් සකස් කරන්නේ කෙසේද?

**කාලය : පැය 13 1/2 යි.**

